සබරගමුව පළාත් සභාව -2025

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

සබරගමුව පළාත් සභාවේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර සම්පිණ්ඩන වාර්තාව 2026 මැයි 31 දින නිකුත් කරන ලද අතර ජාතික විගණන පනතේ 11(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2026 ජුනි 30 දින නිකුත් කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව හා ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ද, වාර්තාවේ පිටපත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාරව පළාත් සභාව ඉදිරියේ තැබීම සඳහා ආණ්ඩුකාරවරයා වෙත ද ඉදිරිපත් කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2025 දෙසැම්බර් 31 දිනට සබරගමුව පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැය විෂයයන් දෙකක ගෙවිය යුතු වියදම් වැඩිපුර දැක්වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වියදම හා බැරකම් රු.28,473,816 ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2026 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී මෙම වරද නිවැරදි කිරීමට සටහන් කර ගන්නා ලද බව. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතු ය. |
| (ආ) | පළාත් සභා මාර්ග පළුදු කිරීම් සහ මාර්ග මතින් නියමිත සීමාවන් ඉක්මවූ ධාරිතා සහිත වාහන ගමන් කිරීම සඳහා අවසර දීමේ දී මාර්ග අමාත්‍යාංශය විසින් අයකර තිබුණු ආපසු නොගෙවන තැන්පතු මුදල් රු.11,453,576 ක් යෝග්‍ය ආදායම් ශීර්ෂයකට බැර නොකර තැන්පතු ගිණුමට බැර කර තිබුණි. තවද, සමාලෝචිත | ඉදිරියේදී පළාත් භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර එම ගාස්තුව ආදායම් ශීර්ෂයකට බැර කිරීමටත් අදාළ වැය ශීර්ෂයකින් ගෙවීම් කිරීමටත් කටයුතු කරන බව. | මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කර තැන්පතු මුදල් නිවැරදි ආදායම් ශීර්ෂවලට බැරකර නිවැරදිව මූල්‍ය ප්‍රකාශන වල දැක්විය යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | වර්ෂයේ උපදේශන දීමනා ලෙස ගෙවීම් කළ රු.3,682,107 ක් ප්‍රමිතකරණය කරන ලද වැය විෂයකට හර නොකර තැන්පතු ගිණුමට හර කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ පළාත් සභාවේ ආදායම සහ වියදම පිළිවෙලින් රු.11,453,576 කින් හා රු.3,682,107 කින් අඩුවෙන් දක්වා තිබුණි. | | |
| (ඇ) | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂයේ දී නිදහස් කර තිබුණු කොන්ත්‍රාත් රැඳවුම් මුදල් රු.2,638,792 ක් තැන්පත් ගිණුමට හර නොකර වියදමක් ලෙස ගිණුම්ගත කර තිබීමෙන් වර්ෂයේ වියදම එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී මෙම රැඳවුම් මුදල්, තැන්පත් ගිණුමට මාරු කිරීමට කටයුතු කරන බව. | ගනුදෙනු මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව ගැලපීමට කටයුතු කළ යුතු ය. |
| (ඈ) | සබරගමුව පළාත් සභා මාර්ග පද්ධතියට දිට්වා සුළි කුණාටුව හේතුවෙන් රු.3,684,900,000 ක හානියක් සිදු වූ බවට ගණනය කර තිබුණු නමුත් ඒ පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල සටහන් මඟින් හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරි මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දි මෙවැනි තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශනවලට බලපාන කරුණු නිවැරදිව හෙළිදරව් කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු ය. |
| (ඉ) | සබරගමුව පළාත් සභාව යටතේ පවතින අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු 09ක ජංගම නොවන වත්කම් අඩුවෙන් හා වැඩියෙන් ගිණුම්ගත කර තිබීමෙන් සමාලෝචිත වර්ෂය අවසානයට පළාත් සභා අරමුදල් ගිණුමේ ජංගම නොවන වත්කම් ශුද්ධ වටිනාකම රු.55,199,949 කින් අඩුවෙන් දැක්වුණි. | 2026 වර්ෂය තුළ ගිණුම් ගත කිරීමට පියවර ගන්නා බව. | ජංගම නොවන වත්කම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු ය. |
| (ඊ) | පළාත් සභාවේ අමාත්‍යාංශ /දෙපාර්තමේන්තු 07 ක ජංගම නොවන වත්කම් තක්සේරු කර ගිණුම්ගත කිරීම සමාලෝචිත වර්ෂය අවසන් වනතුරුද සම්පූර්ණ කර නොතිබුණි. පළාත් සභා අරමුදලේ මූල්‍ය ප්‍රකාශන | 2026 වර්ෂය තුළ තක්සේරු කර ගිණුම් ගත කිරීමට පියවර ගන්නා බව. | ජංගම නොවන වත්කම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට හා අදාළ කටයුතු නිමවන තෙක් ගිණුම්වල හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | තුළ ද එම වත්කම් ඇතුළත්කර නොතිබුණු අතර උචිත පරිදි අදාළ හෙළිදරව් කිරීම් ද සිදුකර නොතිබුණි. | | |
| (උ) | එකතුව රු.21,355,004 ක් වූ බැරකම් ශේෂයන් ඒ ඒ මූල්‍ය ප්‍රකාශනවල බැදීම් හා බැරකම් ලෙස හඳුනාගෙන නොතිබීමෙන් පළාත් සභා අරමුදලේ සමාලෝචිත වර්ෂයට අදාළ වියදම් සහ උපචිත වියදම් ද එම අගයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | සියළුම බැරකම් නිවැරදිව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කරන බව. | සියළුම බැරකම් නිවැරදිව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීම් කළ යුතු ය. |

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පළාත් භාණ්ඩාගාරය ඇතුළු ඒ ඒ ආයතනවල කළමනාකාරීත්වය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව සබරගමුව පළාත් සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා සහ ඊට අදාල විගණන සාක්ෂි ලබාගැනීඹ අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිත භාවය සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාව අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.5.1 ශීර්ෂය 800 - ආණ්ඩුකාරවර කාර්යාලය

#### 1.5.1.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආණ්ඩුකාර ලේකම් කාර්යාලයට අයත් ලෑන්ඩ් රෝවර් ඩිස්කවරි ජීප් රථයක් 2020 සැප්තැම්බර් 07 දින අනතුරට පත්ව අලුත්වැඩියාව සඳහා රු. 5,983,937 ක් 2023 දෙසැම්බර් 30 දින පළාත් සභා අරමුදලින් ගෙවා තිබුණි. මේ සඳහා රුපියල් මිලිනයක මුදලක් 2023 ජුනි 29 දින රක්ෂණ සමාගම විසින් ගෙවා තිබුණ ද රු.4,983,937 ක් වූ ඉතිරි වටිනාකම ලැබී නොතිබුණි. මෙම ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව හා සබරගමුව පළාත් සභාව අතර මැදිහත්කරුවෙකු ලෙස කටයුතු කර අදාළ රක්ෂණ වන්දි මුදල් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ප්‍රධාන ලේකම් විසින් 2026 ජනවාරි 22 දිනැති ලිපිය මගින් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම් මගින් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත දන්වා ඇති බව. | 2026 ජනවාරි 22 දිනැති ලිපිය සම්බන්ධයෙන් රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ප්‍රතිචාර පිළිබඳ පසුවිපරම් කළ යුතු ය. එමඟින් විසඳුමක් නොලැබේ නම් ඉදිරි නීතිමය ක්‍රියාමාර්ග වලට යොමුවීම සඳහා අප්‍රමාදව කටයුතු කළ යුතු ය. |

| | | |
|---|---|---|
| යොමු කර තිබුණු අතර, එහි ප්‍රතිඵලයක් ලෙස සබරගමුව පළාත් ප්‍රධාන ලේකම් වෙත ගෙවීමට ඇති හිඟ මුදල ගෙවන ලෙස රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් විසින් ශ්‍රී ලංකා රක්ෂණ සමාගමට 2025 ඔක්තෝබර් දන්වා තිබුණ ද, 2026 ජුලි වන විටත් ඉතිරි මුදල් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | | |

### 1.5.2 ශීර්ෂය 802 - පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය

#### 1.5.2.1 කාර්ය මණ්ඩල පරිපාලනය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය I කාණ්ඩයේ II වැනි පරිච්ඡේදයේ 13.3 ඡේදය අනුව වැඩ බැලිමේ පත් කිරීමක් කළ යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් පමණක් වන අතර තනතුරට පූර්ණ කාලීන නිලධරයෙකුගේ සේවය අවශ්‍ය නම් නිත්‍ය පත් කිරීම නොපමාව කළ යුතු ය. පූර්ණ කාලීන නිලධරයෙකුගේ සේවය අවශ්‍ය නොවේ නම් 13:2 උප වගන්තිය පරිදි දෙපාර්තමේන්තුවේ අනෙක් නිලධරයන් අතර රාජකාරි බෙදා දිය යුතු වුවත්, 2005 වර්ෂයේ සිට පුරප්පාඩුව පවතින පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සහකාර ලේකම් තනතුරක් සඳහා වසර 20 කට වැඩි කාලයක් වැඩ බැලීමට නිලධාරීන් පත් කර තිබුණි. | මෙම කාර්යාලයේ දෛනික කටයුතු සඳහා සහ විභාග ඒකකයේ කටයුතු සඳහා සහකාර ලේකම් තනතුරු දෙක ආයතන හා විභාග වශයෙන් පැවතීම අත්‍යාවශ්‍ය බව. | පූර්ණ කාලීන නිලධරයෙකුගේ සේවය අවශ්‍ය නම් නිත්‍ය පත් කිරීම නොපමාව සිදු කරවා ගැනීමට කටයුතු කළ යුතු ය. |

### 1.5.3 ශීර්ෂය 804 – පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය

#### 1.5.3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| 2024 දෙසැම්බර් 03 සිට 07 දක්වා ඉන්දියාවේ ලක්නව්හි පැවැති 25 වන ජාත්‍යන්තර සිසු තත්ත්ව කව සම්මේලනයට සහභාගි ව තිබූ අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන් 08 දෙනෙකු වෙත මුදල් ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශ ලේකම්ගේ 2023 මාර්තු 20 දිනැති අංක MF/06/23/50/2023 දරන ලිපිය මඟින් සංශෝධිත 2015 මැයි 10 දිනැති අංක මු.අ.01/2015/01 චක්‍රලේඛයේ 03 (අ) වගන්තිය ප්‍රකාරව එක් දිනකට ගෙවිය යුතු ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් 25 ඉක්මවා අනියම් දීමනාව වශයෙන් දිනකට ඩොලර් 40 බැගින් දින 09 ක් සඳහා ගෙවා තිබීම හේතුවෙන් ඇමරිකානු එ.ජ. ඩොලර් 1080 ක් (රු.322,498 ක්)වැඩිපුර ගෙවා තිබුණි. එසේම, යථෝක්ත සම්මේලනය 2024 දෙසැම්බර් 03 සිට දෙසැම්බර් 07 දක්වා පවත්වා තිබුණ ද , පිටත්වීම සහ ආපසු පැමිණීම පිළිවෙලින් දෙසැම්බර් 01 සහ 10 ලෙස ගුවන් ගමන් වෙන්කර තිබීමෙන් විදේශ නිවාඩු දින 02 ක් වැඩිපුර ලබා දී ඒ සඳහා අනියම් දීමනාව ඇමරිකානු ඩොලර් 400 ක් එනම්, රු.119,445 ක් වැඩිපුර ගෙවා තිබුණි. | 01/2015/01 හි 03 (ආ) ඡේදයේ සඳහන් පරිදි එනම්, “නිල දූත කාර්යයක් හෝ දිවයින තුළ ඉටු කළ නොහැකි ආයතනයේ විෂයය පථයට අදාළ රාජකාරි කටයුත්තක් හෝ කාර්යයක් සඳහා රජය නියෝජනය කරමින් විදේශගත වීමකදී අනියම් දීමනා ගෙවීම” යටතේ අනුමැතිය ඉල්ලා ඇති බව. | නිල දූත කාර්යයක් සඳහා විදේශ ගතවීමක දී විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතු ය. ඒ සඳහා රාජ්‍ය තාන්ත්‍රික නිල ආරාධනාවක් ද තිබිය යුතු ය. ජාත්‍යන්තර සිසු තත්ත්වකව සම්මේලනය එවැනි නිලදූත කාර්යයක් නොවන බැවින් වැඩිපුර ගෙවා ඇති දීමනා ආපසු අයකරගත යුතු ය. |

#### 1.5.3.2 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රධාන ලේකම් වැය ශීර්ෂය සඳහා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ නම්‍යශීලී අරමුදල හා විශේෂ සංවර්ධන ව්‍යාපෘති 120 ක් සඳහා වෙන් ලද කරන රු.මිලියන 501 ක | පිළිතුරු ලබා දී නොමැත. | සබරගමුව පළාත සඳහා විධිමත් සංවර්ධන සැලැස්මක් සකස් කළ යුතු අතර, එයට ඇතුළත් එක් එක් සංවර්ධන ව්‍යාපෘති |

| | | | |
|---|---|---|---|
| | ප්‍රතිපාදනයෙන් රු.මිලියන 186.85 ක ව්‍යාපෘති 87 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි. ඒ අනුව සමස්ථ ප්‍රතිපාදනයෙන් සියයට 63 ක් 2025 වර්ෂය අවසන් වන විට ඉතිරි වී තිබුණි. 2025 දෙසැම්බර් 31 වන විට අදාළ සියලු වැඩ විෂයයන් ක්‍රියාත්මක කර අවසන් කිරීමටත්, ව්‍යාපෘති අවිච්ඡේද නොකිරීමටත් ප්‍රධාන ලේකම් විසින් ප්‍රතිපාදන වෙන්කර දෙන අවස්ථාවේදීම උපදෙස් ලබාදී තිබුණ ද ඒ අනුව කටයුතු කර නොතිබුණු අතර , සංවර්ධන යෝජනා සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමට පෙර එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ශක්‍යතාවය පිළිබඳ පූර්ව ඇගයීමක් කර නොතිබීම ද ප්‍රතිපාදන ඉතිරි වීමට හේතු වී තිබුණි. | | සඳහා ශක්‍යතා අධ්‍යයන කටයුතු අවසන් කර ප්‍රතිපාදන වෙන් කිරීම් මගින් උපරිම කාර්යක්ෂමතාවයකින් ප්‍රතිපාදන උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු ය. |
| (ආ) | සබරගමුව පළාත් සභාවට අයත් පාසල් හා රෝහල් ගොඩනැඟිලි වහල මත පුනර්ජනනීය විදුලි බලය උත්පාදනය කිරීමේ ව්‍යාපෘතියක් සඳහා ප්‍රධාන ලේකම් විසින් 2022 සැප්තැම්බර් 01 දින පෞද්ගලික සමාගමක් සමඟ ගිවිසුම්ගත වී තිබුණි. ව්‍යාපෘතිය මඟින් වසරකට මෙගාවොට් 40 ක විදුලි ජනනයක් තුළින් වසර 20 ක් තුළ රු.මිලියන 19,147 ක සමස්ථ ආදායමක් අපේක්ෂා කර තිබුණු අතර, ඉන් සබරගමුව පළාත් සභාවට රු.මිලියන 2910 ක ආදායමක් අපේක්ෂා කර තිබුණි. එසේ වුවද, සමාලෝචිත වර්ෂය අවසන් වන විට වසර 03 ක් ගත වී තිබුණ ද උත්පාදනය කර තිබුණු විදුලි ජනනය මෙගාවොට් 10 ක් පමණක් විය. ගිවිසුම්ගත දින සිට වසරක් ඇතුළත පළාත තුළ පිහිටි පාසැල් හා රෝහල් ගොඩනැගිලි 1124 ක වහලයන් මත සූර්ය විදුලි උත්පාදන පද්ධති සවි කිරීමට නියමිතව තිබුණ ද, පාසල් 135 ක හා රෝහල් 05 ක පමණක් එම පැනල සවි කර තිබීම හේතුවෙන් ව්‍යාපෘතියේ අරමුණු ළඟා කර ගැනීමට නොහැකි වී තිබුණි. | ඉලක්ක කරන ලද ආදායම් මට්ටම්වලට ළඟා වීමට නොහැකි වීමට බලපා ඇති පද්ධති ඉදිකිරීමේ ප්‍රමාදය තවදුරටත් දැඩිව පවතිනුයේ රාජ්‍ය බදු ප්‍රතිපත්ති වෙනස් වීම හා ලංකා විදුලි බල මණ්ඩලයේ ආයෝජන ප්‍රතිපත්ති වෙනස්වීම යන බාහිර සාධක ප්‍රමුඛ වීම මත බව. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කරවා ගෙන ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතු ය. |

### 1.5.4 ශීර්ෂය 807 - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ක්‍රමසම්පාදන)

#### 1.5.4.1 අපේක්ෂිත නිමවුම් ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| 2025 සබරගමුව පළාත් වාර්ෂික සංවර්ධන සැලැස්ම (සංශෝධිත) අනුව සංරචක 10 ක් යටතේ ඉටු කිරීමට සැලසුම් කර තිබුණු ඇස්තමේන්තු වටිනාකම් එකතුව රු.මිලියන 246.6 ක් වූ ක්‍රියාකාරකම් 103 ක් ඉටු නොකර අවලංගු කර තිබුණි. ව්‍යාපෘති වාර්තා සකස් කිරීමේදී හා ශක්‍යතා අධ්‍යන අදියරේදී විශේෂ අවධානයක් යොමු කළ යුතු රජයේ විවිධ දෙපාර්තමේන්තු සහ ආයතන වලින් ලබා ගත යුතු අනුමැතීන් සහ එකඟතාවයක් ලබා ගැනීමේ හැකියාව පිළිබඳව අවධානය යොමු නොකර එම සැලසුම් සකස් කර තිබීම මෙන්ම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාලරාමුව සැලසුම් කර නොතිබීම ද මේ සඳහා හේතුවී තිබුණි. | එක් එක් සංරචකයන්ට අදාළව අවලංගු කළ කර්මාන්ත ලැයිස්තු ඉදිරිපත් කර ඇති බව. | ඉදිරියේ දී විධිමත් පරිදි සංවර්ධන සැලසුම් සකස් කිරීමට හා එම සැලසුම් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු ය. |

### 1.5.5 ශීර්ෂය 809 - පළාත් ආදායම් දෙපාර්තමේන්තුව

#### 1.5.5.1 ආදායම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයේ හිඟ ආදායම රු.111,618,421 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසානයට හිඟය රු.129,125,567 ක් වීමෙන් හිඟ ආදායම සියයට 15.7 කින් වැඩි වී තිබුණි. | 2025 දෙසැම්බර් 31 දිනට රු.129,125,566 ක හිඟ බද්දක් පවතින බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතු ය. |
| (ආ) | 2008 අංක 04 දරන ප්‍රඥප්තිය මගින් සංශෝධිත සබරගමුව පළාත් සභාවේ 1993 අංක 02 දරන මුද්දර ගාස්තු හැරවීමේ ප්‍රඥප්තියේ 02 ඡේදය ප්‍රකාරව , පළාත් සභා අරමුදලට ගෙවා ඇති මුද්දර ගාස්තු ආදායම ඒ ඒ පළාත් පාලන ආයතන ප්‍රධානීන්ගේ ඉල්ලීම මත සහ පළාත් ආදායම් | උපලේඛන වල එකම ඔප්පුව හා ඊට අදාළ මුද්දර ගාස්තුව කිහිපවරක් සටහන් කිරීම, වෙනත් පළාත් වල පිහිටි නිශ්චල දේපළ සඳහා ලියන ලද ඔප්පුවල විස්තර සටහන් කර තිබීම සහ දේපළ සබරගමුව පළාතේ පිහිටා තිබුණද මුද්දර ගාස්තුව වෙනත් පළාත් වලට ගෙවා තිබීම, | අදාළ ප්‍රඥප්තිය අනුව පළාත් පාලන ආයතනවලට හිමි යුතු මුද්දර ගාස්තු අප්‍රමාදව එම ආයතන වෙත ලබාදීමට කටයුතු කළ යුතු ය. |

| | |
|---|---|
| කොමසාරිස් විසින් සහතික කරන ලද උපලේඛනයන් මත පළාත් පාලන ආයතනවලට හරවා යැවිය යුතු වුවත්, රත්නපුර හා කෑගල්ල දිස්ත්‍රික්ක 02 සඳහා 2024 වර්ෂයේ ඉල්ලීම් කළ උපලේඛන 230 කට අදාළව රු.9,516,909 ක් ද, 2025 වර්ෂය සඳහා ඉල්ලුම් කළ උපලේඛන 401 කට අදාළව රු.40,780,379 ක් ද ලෙස උපලේඛන 631 ක් සඳහා රු.50,297,288 ක් උප ලේඛණ වල පවතින දෝෂ නිවැරදි කිරීම ප්‍රමාද විම හේතුවෙන් 2026 අප්‍රේල් 30 වන විට ද හරවා යවා නොතිබුණි. | උපලේඛන වල ඇති ගණිතමය දෝෂ සහ වෙනත් කරුණු හේතුවෙන් නැවත පරීක්ෂා කර නිවැරදි කිරීම සඳහා අදාළ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල වෙත උපලේඛන යොමුකර තිබීම හා දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට මේ වන විට පැවරී ඇති ආදායම් රැස්කිරීමේ අධික රාජකාරී කටයුතු හේතුවෙන් ප්‍රමාදවීම් සිදුව ඇති බව. |

### 1.5.6 ශීර්ෂය 810- නීතිය හා සාමය, මුදල් හා සැලසුම්, පළාත් පාලන, සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, වනිතා කටයුතු, සමූපකාර, වෙළඳ හා ආහාර, ප්‍රවාහන, වතු සුභ සාධන, පරිසර, ප්‍රවෘත්ති, නිවාස හා ඉදිකිරීම් සහ ආගමික කටයුතු පළාත් අමාත්‍යාංශය

#### 1.5.6.1 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් පාලන බල ප්‍රදේශවල සංචාරක යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන - 2024 යටතේ රත්නපුර නවනගර නාගරික උද්‍යානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා 2024 ජුලි 11 දින අනුමැතිය ලබා දී තිබූ නමුත්, ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය, ශ්‍රමය හා යන්ත්‍ර අවශ්‍යතාවය තීරණය කිරීම සඳහා ඇස්තමේන්තුවක් සකස් කර අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබුණි. නමුත්, ව්‍යාපෘතිය වෙනුවෙන් 2024 මාර්තු 27 දිනැතිව පවත්වා තිබූ සමාරම්භක උත්සවය සඳහා පළාත් ප්‍රධාන ලේකම්ගේ උපදෙස් මත 2024 ජනවාරි 10 දිනැති අංක 01/2024 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 12.3 උප වගන්තියට පටහැනිව රත්නපුර මහා නගර සභා අරමුදලින් රු. 944,050 ක් වැය කර තිබුණි. | සමාරම්භක උත්සවය සම්බන්ධයෙන් නාගරික කොමසාරිස් වෙතින් කරුණු විමසා ලිපියක් යවා ඇති අතර 3M සැලැස්ම සම්බන්ධයෙන් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) වෙතින් කරුණු විමසා ලිපියක් යවා ඇති බව. | යොමුගත චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. ඍජු ශ්‍රම පදනමින් ක්‍රියාත්මක කරන ව්‍යාපෘතිවල පිරිවැය පාලනය සඳහා ද්‍රව්‍ය, ශ්‍රම හා යන්ත්‍ර (3M) ඇස්තමේන්තු සකස් කර අනුමත කරවා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | නාගරික උද්‍යානයේ ඉදිකිරීම් කටයුතු 2024 ජූලි ආරම්භ කර තිබුණ ද, 2026 මැයි 10 දින වන විටත් එහි වැඩ අවසන් කර නොතිබුණු අතර ඉදිකිරීම් භූමිය වල්බිහි වී තිබුණි. 2024 දෙසැම්බර් 31 දින රු.6,440,440 කට මිලදී ගෙන තිබුණු ළමා උද්‍යානයේ හා ව්‍යායාම් ඒකකයේ උපකරණ හා රු.4,083,815 ක් වටිනාකමැති රබර් ටයිල් තොගය ද නිෂ්කාර්යව ගබඩා කර පැවතුණි. | උපකරණ මිලදී ගැනීමට ලැබුණු රු.මිලියන 60 ක පමණ ප්‍රතිපාදනය 2024 වර්ෂයේ දී වියදම් කළයුතුවීමත් ඉදිරියේදී මිලදී ගැනීම් සඳහා ප්‍රතිපාදන සපයා ගැනීම අසීරු වීමත් නිසා අදාළ මිලදී ගැනීම් සිදු කෙරුණි. තවමත් ඉදිකිරීම් කටයුතු සිදුවන බැවින් එම උපකරණ වලට හානි සිදුවිය හැකි නිසා සවි කර නොමැති අතර ඉදිකිරීම් අවසන් කළ පසුව සවි කරන බව. | නියමිත ප්‍රමිතියට අනුකූලව නාගරික උද්‍යානය ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතු ය. |

### 1.5.6.2 නොවිසඳුනු විගණන ඡේද

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | “2021 - 2030 රත්නපුර නගර සංවර්ධන සැලැස්ම“ යටතේ හඳුනාගෙන තිබුණු රත්නපුර නවනගරය බස් නැවතුම්පොළ ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා 2025 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 94.8 ක් වැය කර තිබියදී, එම ව්‍යාපෘතිය ප්‍රවාහන ක්ෂේත්‍රය හා සම්බන්ධ රජයේ ප්‍රතිපත්ති සමඟ අනුකූල නොවන බව දක්වමින් භූමිය තුළ අත්‍යවශ්‍ය වැඩ කොටස් අවසන් කර අන්‍යෝන්‍ය එකඟතාව මත ගිවිසුම අවසන් කර එම භූමිය හා ඉදිකිරීම් වෙනත් ආර්ථික හා සමාජයීය වශයෙන් ඵලදායී කාර්යයක් සඳහා යොදා ගැනීමට තීරණය කර තිබුණි. එහෙත්, 2026 අගෝස්තු 25 වන විටත් එය නිෂ්කාර්යයව පැවතුණු අතර, බිල්පත් හා භෞතික පරීක්ෂාවේදී ලබාගත් මිනුම් අනුව නිම කර තිබුණු වැඩ කොටස්වලට අදාළව රු.2,234,296 ක් වැඩිපුර ගෙවා තිබුණි. එමෙන්ම වේයන් මර්ධන ප්‍රතිකාරය අසාර්ථක වීමෙන් ඒ සඳහා වැය කර තිබුණු රු.548,991 ක් ද නිෂ්ඵල වියදමක් වී තිබුණි. | ඉදිකිරීමේ අඩුපාඩු සම්බන්ධව නාගරික සංවර්ධන අධිකාරිය වෙතින් කරුණු විමසා ලිපියක් යවා ඇති බව. | ව්‍යාපෘතිය සඳහා දරන ලද වියදම හා එම භූමිය ඵලදායි ලෙස උපයෝජනය සඳහා සුදුසු කාර්යයක් හෝ ව්‍යාපෘතියක් හඳුනාගෙන ක්‍රියාත්මක කිරීමට අප්‍රමාදව කටයුතු කළ යුතු ය. එමෙන් ම, වැඩිපුර ගෙවීම් ආපසු අයකර ගැනීමට ද කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | නිසි අවශ්‍යතා අධ්‍යයනයකින් තොරව 2015 වර්ෂයේ දී රු.58,308,411 ක් වැය කර කම්පැක්ටර් යන්ත්‍ර 14 ක් මිලට ගෙන සබරගමුව පළාතේ පළාත් පාලන ආයතන 14 ක් වෙත බෙදා හැර තිබුණු නමුත් එම යන්ත්‍ර කඳු බෑවුම් සහිත පටු මාර්ගවල ධාවනයට යෝග්‍ය නොවන පළලකින් හා බරකින් යුක්ත වීම නිසා ඉන් යන්ත්‍ර 13 ක් භාවිතයට ගැනීමකින් තොරව නිෂ්කාර්යව පැවතුණි. | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කර ඇති අතර ඒ සම්බන්ධව විමර්ශනයක් සිදු කිරීමට තීරණය කර ඇති බව ආණ්ඩුකාර ලේකම් වෙත දන්වා ඇත.<br>ධාවනය කළ නොහැකි බව පරීක්ෂා කර බලා විස්තරාත්මක වාර්තාවක් ලබා ගැනීම සඳහා ප්‍රධාන ලේකම් විසින් නිලධාරීන් තිදෙනෙකුගෙන් සමන්විත කමිටුවක් පත් කර ඇති බව. | ප්‍රධාන ලේකම් විසින් පත්කළ කමිටුවේ විමර්ශන කඩිනම් කර විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර වත්කම් වලින් ප්‍රයෝජන ගැනීමට හෝ අදාළ ආයතනයකට ලබා දීමට කටයුතු කළයුතු ය. |
| (ඇ) | 2021 සහ 2022 වර්ෂයන්හි දී සීඝ්‍රයෙන් වැඩි වූ යෙදවුම් මිල ගණන් 2023 වර්ෂයේ සිට නැවත අඩුවන ප්‍රවණතාවයක් පෙන්නුම් කළ ද, ඒ පිළිබඳව නොසලකා හැරීමෙන් ව්‍යාපෘති 7 ක මිල විචලන සඳහා අයකර ගත යුතු රු.1,730,655 ක් අයකරගෙන නොතිබුණි. | 2023 හි 2024 වර්ෂවල කොන්ත්‍රාත් ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා මිල විචලන මත සිදුව ඇති වැඩිපුර ගෙවීම් ආපසු ගෙවන ලෙස අදාළ කොන්ත්‍රාත් ආයතන වෙත දන්වා ඇත. මිල විචලන ගලපා පසුව ඉදිරිපත් වූ සියළු බිල්පත් වලින් අදාළ මිල විචලනයන් ආපසු අයකර ඇති බව. | වැඩිපුර ගෙවීම් කොන්ත්‍රාත්කරුවන්ගෙන් හෝ වගකිවයුතු නිලධාරීන්ගෙන් අය කර ගත යුතු ය. |

**1.5.6.3 හඳුනාගන්නා ලද පාඩු**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2000 වර්ෂයේ සිට 2024 දක්වා කාල සීමාව තුළ ප්‍රධාන අමාත්‍යාංශයට අයත් වාහනවල සිදුව තිබුණු අනතුරු 25 කට අදාළ එකතුව රු.10,310,280 ක අලාභය සම්බන්ධයෙන් සබරගමුව පළාත් මූල්‍ය රීති සංග්‍රහයේ 54.1 රීතිය ප්‍රකාරව කටයුතු කර වගකිව යුතු පාර්ශව වලින් ඒවා අය කරගැනීමට හෝ විධිමත් අනුමැතිය මත කපා හැරීමට කටයුතු කර නොතිබුණි. | හදිසි අනතුරුවලට අමතරව හානි හා පාඩු ලේඛනයේ සඳහන් අනතුරුවලට අදාළ පරීක්ෂණ කටයුතු අවසන් කර ඇත. ජීප් රථයේ අලාභ වටිනාකම වන රු.8,961,340 ක මුදල රක්ෂණ සමාගමෙන් අය කර ගැනීමට අදාළ කටයුතු ප්‍රධාන ලේකම් කාර්යාලය විසින් තව දුරටත් සිදු කරමින් ඇති බව. | යොමුගත රීති අනුව අප්‍රමාදව කටයුතු කර වගකිවයුතු පාර්ශවවලින් අයකර ගැනීමට හෝ විධිමත් අනුමැතිය මත කපා හැරීමට කටයුතු කළ යුතු ය. |

**1.5.6.4 සබරගමුව සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරිය**

**1.5.6.4.1 ලැබිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| 2025 දෙසැම්බර් 31 දිනට ණයගැති කාල විශ්ලේෂණයට අනුව වසර තුන ඉක්මවූ ණයගැති ශේෂය රු.25,453,949 ක් වූ අතර, ණයගැතියන් තිදෙනෙකුට අදාළ රු.10,551,499 ක් ඒ තුළ ඇතුළත්ව තිබුණි. | එක් ආයතනයක් සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කර ඇති බව. | හිඟ ණය ශේෂ අයකර ගැනීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතු ය. |

**1.5.6.5 සබරගමුව මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය**

**1.5.6.5.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්**

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | සබරගමුව පළාත් සභාවේ 1994 අංක 01 දරන මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තියේ 09 හා 19වන ඡේද | අවසර පත්‍රයේ වලංගු කාලය අවසන් වූ බස්රථ 67 ක් මගී සේවා අවසර පත්‍ර අළුත් කර නොතිබුණු අතර අදාළ හිඟ අවසර පත්‍ර ගාස්තුව හා අධිභාර මුදල රු.811,900 ක් අයකර නොතිබුණි. | පිළිගන්නා බව. | ප්‍රඥප්තිය අනුව කටයුතු කර මගී සේවා බස් අවසර පත්‍ර අළුත් කිරීමට හා ගාස්තු හා අධිභාර මුදල් අයකිරීමට කටයුතු කළයුතු ය. |
| (ආ) | සබරගමුව පළාත් සභාවේ 1994 අංක 01 දරන මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තියේ 30(1) සහ 30(2) ඡේද | ප්‍රඥප්තියේ 33 ඡේදය ප්‍රකාරව පනවනු ලබන මාර්ග පරීක්ෂක දඩ හා එම දඩ මුදල් ගෙවීමේ ප්‍රමාදයන් සඳහා අධිභාරයන් අය කිරීම් සම්බන්ධයෙන් රීති සදා ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කර නොතිබුණි | තවම සබරගමුව පළාත් සභාව පිහිටුවා නොමැති බැවින් ඉදිරියේදී අධිකාරියේ රීති ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කිරීමට කටයුතු කරන බව.<br><br>ඉදිරියේදි ජාතික ගමනා ගමන කොමිෂන් සභාව මඟින් තීරණය කර ඇති දඩ සංශෝධනයද අප අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් අනුමත කර ගැනීමට කටයුතු සිදුකරන බව. | අදාළ රීති සකස් කර ගැසට් මඟින් ප්‍රසිද්ධ කළ යුතු ය. |

**1.5.6.5.2 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවන ගනුදෙනු**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත නොකළ තනතුරු 03 ක් සඳහා නිලධාරීන් 07 දෙනෙකු බඳවාගෙන තිබුණු අතර ඉන් 06 දෙනෙකුගේ පත්වීම් අධ්‍යක්ෂ මණ්ඩලය අනුමතකර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් මූලික විමර්ශණයක් ප්‍රධාන අමාත්‍යාංශය මඟින් පත්කරන ලද කමිටුවක් මඟින් සිදුකරමින් පවතින බව. | විමර්ශණ කඩිනම් කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය රහිතව බඳවාගැනීම සම්බන්ධයෙන් හා වගකිව යුතු නිළධාරීන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගත යුතු ය. |
| (ආ) | පරීක්ෂා කරන ලද මාර්ග බලපත්‍ර 53 ක නියදියක් අනුව, නව මාර්ග බලපත්‍ර නිකුත් කිරීමේදී ටෙන්ඩර් පටිපාටිය අනුගමනය නොකර විවිධ පාර්ශවයන්ගේ ලිපි පදනම් කර ගනිමින් නව මාර්ග බලපත්‍ර 44 ක් නිකුත් කර තිබුණි. එමෙන්ම, අධ්‍යක්ෂ මණ්ඩල තීරණයකින් තොරව නව බලපත්‍ර ගාස්තු අවමය රු.50,000 ක සිට රු.200,000 ක් දක්වා අයකර ගෙන තිබුණි. | කමිටුවක් මඟින් පරීක්ෂණයක් සිදු කර අදාළ වර්ථාවේ ඇතුළත් නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය පත්‍රිකා අංක 47 යටතේ තීරණය කර ඇති බව. | පරීක්ෂණ කඩිනම් කර වගකිව යුතු පාර්ශව සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ය. |

**1.5.6.5.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ හිඟ ලොග්පත්‍ර ආදායම රු. 3,167,600 ක් වූ අතර එයින් බස්රථ 27 කට අදාළව රු. 696,850 ක් මාස 13 ත් 57 ත් අතර කාලයක සිට හිඟව පැවතුණි. | අනාර්ථික වීම මත මෙම බලපත්‍ර බස් කර්මාන්තයෙන් ඉවත් වී ඇති බව. | හිඟ ආදායම අයකර ගැනීමට කටයුතු කළයුතු ය. |
| (ආ) | අන්තර් පළාත් පිවිසුම් වෙනුවෙන් බස්රථ 53 කින් රු.3,447,400 ක් හිඟව පැවති අතර ඉන් බස් රථ 26 ක් වෙනුවෙන් රු.2,830,900 ක් වූ පිවිසුම් ගාස්තු මාස 13 ත් 57 ත් අතර කාලයක සිට හිඟව පැවතුණි. | ඉදිරියේ දී අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු ය. |
| (ඇ) | ලැබිය යුතු කඩ කුලී ආදායම් ලේඛනය අනුව කඩ කාමර 65 කට අදාළව රු. 3,911,356 ක මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේ දී අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ කඩකුලී කඩිනමින් අයකරගත යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | බලපත්‍ර ලබා ධාවනය නොවන බස්රථ 138 ක් පැවතීමෙන් මහින්ට ප්‍රමාණවත් ප්‍රවාහන සේවාවක් ලබා දීමේ අරමුණ ඉටු වී නොතිබුණි. එහෙත්, එම බලපත්‍ර අවලංගු කර නව බලපත්‍ර නිකුත් කිරිමට අධිකාරිය කටයුතු කර නොතිබුණි. | සියලුම ස්ථානභාර නිළධාරීන් හරහා ඉතා නිවැරදි නාම ලේඛණයක් ලබාගැනීම මහින් බලපත්‍රය අවලංගු කිරීමට 2023 මාර්තු 21 අධ්‍යක්ෂ මණ්ඩලය තින්දුව අනුව කටයුතු සිදුකරමින් පවතින බව. | ධාවනයෙහි නොයොදවන බස්රථවල බලපත්‍ර අවලංගු කර නව බලපත්‍ර ප්‍රදානය කිරීමට කටයුතු කළ යුතු ය. |

**1.5.6.5.4 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර තිබුණු සේවක සංඛ්‍යාව 118 ක් වුවද, 2025 දෙසැම්බර් 31 දිනට සේවයේ නියුක්ත සංඛ්‍යාව 149 ක් වීමෙන් 31 දෙනෙකු අතිරික්ත ව සේවයේ යොදවා තිබුණි. | කිහිප අවස්ථාවකදීම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අතිරික්ත සේවකයින් අනුමත කර ගැනීමට උත්සහ දැරුවත් එය අසාර්ථක විය. නැවත 2026 මාර්තු 09 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අතිරික්ත සේවකයින් අනුමත කර ගැනිමට අවශ්‍ය කටයුතු සිදුකර දෙන ලෙස ප්‍රධාන අමාත්‍යාංශයට ලිඛිතව දැනුම් දීම් සිදු කළ ද, ගොනුවල අඩුපාඩු පැවතීම හේතුවෙන් ඒවා නිවැරදි කර එවන ලෙස අධිකාරියට ලිඛිතව දන්වා ඇති බව. | අනුමත කාර්ය මණ්ඩලය තුලනය කරවා ගැනීමට හා අනුමත කරවා ගැනීමට කටයුතු කළයුතු ය. |

**1.5.6.6 පින්නවල ඉපැරණිගම තේමා උද්‍යානය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|

**1.5.6.6.1 ආදායම් කළමනාකරණය**

| | | |
|---|---|---|
| 2024 වර්ෂයේ වැඩසටහන් ආදායම් රු.558,750 ක් ලැබී තිබුණ ද සමාලෝචිත වර්ෂයේදී එම ආදායම රු.39,000 ක් දක්වා අඩු වී තිබුණු අතර, එය පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 93 ක අඩුවීමක් විය. | ඉදිරියේදී ආදායම් වැඩි කිරීමට සැලසුම් කර ඇති බව. | ආදායම් වර්ධනය කර ගැනීම සඳහා අවධානය යොමු කළ යුතු ය. |

**1.5.6.6.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට ආයතනයේ බැංකු ගිණුමේ රු.4,852,947 ක ශේෂයක් පැවතිය ද, මෙහෙයුම් කටයුතු සඳහා ප්‍රමාණවත් මුදලක් රඳවාගෙන ඉතිරි ශේෂය ඵලදායි ලෙස ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි. | ස්ථාවර තැන්පතු ආරම්භ කිරීමට කටයුතු කරන බව. | අමතර මුදල් ආයෝජනය සඳහා අවධානය යොමු කළ යුතු ය. |

**1.5.6.7 නිවාස සංවර්ධන අරමුදල**

**1.5.6.7.1 නිතී, රීතී හා රෙගුලාසි වලට අනුකූල නොවීම.**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| 1993 දෙසැම්බර් 23 දින සිට පළාත් සභාව විසුරුවා හරින ලද 2017 සැප්තැම්බර් 26 දින තෙක් වසර 14 ක් ක්‍රියාකාරීව පවත්වාගෙන ගොස් තිබුණ ද, 1993 අංක 05 දරන සබරගමුව පළාතේ නිවාස සංවර්ධන අරමුදල පිහිටුවීම පිළිබඳ ප්‍රඥප්තියේ 07 වන වගන්තිය ප්‍රකාරව අරමුදලේ මුදල් යෙදවීමේ ක්‍රම පිළිබඳව රෙගුලාසි සකස් කර නොතිබුණි. | රෙගුලාසි සකස් කර ගැනීමේ බලය අමාත්‍යවරයා සතු වන බැවින් නැවත පළාත් සභාව පිහිටුවීමෙන් පසුව අමාත්‍යවරයා සමඟ සාකච්ඡා කර අරමුදලේ මුදල් යෙදවීමේ රෙගුලාසි සකස් කර අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන බව. | අරමුදලේ මුදල් යෙදවීම පිළිබඳ රෙගුලාසි සකස් කර ඒ අනුව කටයුතු කළ යුතු ය. |

**1.5.7 ශීර්ෂය - 811- පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**

**1.5.7.1 නීති රීති හා රෙගුලාසිවලට අනුකූළ නොවීම.**

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූළ නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| 2017 දෙසැම්බර් 21 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 02/2017 හි 02 ඡේදය | සබරගමුව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව යටතේ පවතින වාහන 21 ක හිමිකාරීත්වය දෙපාර්තමේන්තුව වෙත පවරාගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව. | වාහනවල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු ය. |

### 1.5.7.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බලංගොඩ සහ කරවනැල්ල මූලික රෝහල් A ශ්‍රේණියේ මූලික රෝහල් ලෙස හා ඇහැලියගොඩ, කොලොන්න, කළවාන කහවත්ත සහ වරකාපොල යන මූලික රෝහල් B ශ්‍රේණියේ රෝහල් ලෙස ශ්‍රේණිගත කර තිබුණද, සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ 2021 දෙසැම්බර් 27 දිනැති පොදු චක්‍රලේඛ අංක 01-18-2020(1) මඟින් පෙන්වා දී තිබුණු A සහ B ශ්‍රේණියේ මූලික රෝහලක තිබිය යුතු පහසුකම් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සපුරා නොතිබුණි. | රෝහල් වල තත්වය උසස් කළ විට සේවක සංඛ්‍යා කඩිනමින් යාවත්කාලීන වීම සිදු නොවන අතර, සේවක සංඛ්‍යා සංශෝධනය කිරීම සඳහා මූලික සාකච්ඡා 2025 පැවැත්වුවද මෙතෙක් ඒ සඳහා අනුමැතිය හිමි වී නොමැත. මෙය පළාත් සභාව වෙත පමණක් සිදුකළ හැකි කාරණයක් නොවන බව. | සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ 2021 දෙසැම්බර් 27 දිනැති පොදු චක්‍රලේඛ අංක 01-18-2020(1) ප්‍රකාරව අවශ්‍ය පහසුකම් සපුරා ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතු ය. |
| (ආ) | කහවත්ත රෝහලේ 2025 දෙසැම්බර් 23 දින වන විට සායනික ඖෂධාගාරය (Clinic Pharmacy), බාහිර ඖෂධාගාරය (OPD Pharmacy) හා ගෘහස්ථ ඖෂධාගාරය (Indoor Pharmacy) තුළ රෝගී ප්‍රතිකාර සඳහා නිරන්තරයෙන් අවශ්‍ය වන ඖෂධ 71 ක් මාස 01 සිට අවුරුදු 04 ක කාලයක් ශූන්‍ය වී පැවතුණි. මේ නිසා ප්‍රතිකාර ගැනීමට පැමිණෙන රෝගීන්ට එම ඖෂධ බාහිරින් මිලදී ගැනීමට සිදුව තිබුණි. | එක් එක් දිස්ත්‍රික්ක සඳහා අවශ්‍ය තොග මධ්‍යම බෙහෙත් ගබඩාවට ලැබුණු පසු ප්‍රාදේශීය වෛද්‍ය සැපයුම් ඒකක විසින් එම තොග අදාළ රෝහල් සඳහා ලබා දීම සිදු කරන බවත්, මෙය ජාතික මට්ටමින් විසඳිය යුතු ගැටලුවක් බව. | රෝගී සත්කාර සේවාව සඳහා අවශ්‍ය ඖෂධ අප්‍රමාදව ඇස්තමේන්තු කර ඉල්ලා ගැනීමට කටයුතු කළයුතු ය. |

### 1.5.7.3 ප්‍රමාද වූ ව්‍යාපෘති

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බලංගොඩ මූලික රෝහලේ තෙමහල් ගොඩනැගිල්ල නවීකරණය කිරීම රු.36,122,398 ක කොන්ත්‍රාත් වටිනාකමකට වර්ෂයක් තුළ නිම කිරීම සඳහා 2020 නොවැම්බර් 03 දින ගිවිසුම්ගතව තිබුණද, රු.3,994,211 ක වැඩ නිම කිරීමෙන් පසු 2022 නොවැම්බර් 25 දින ගිවිසුම අවලංගු කර තිබුණි. පසුව 2023 ඔක්තෝබර් 23 දින රු.23,637,905 ක කොන්ත්‍රාත් වටිනාකමට සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරිය සමඟ ගිවිසුම්ගත වී තිබුණ ද, රු.17,078,214 ක වැඩ නිම කිරීමෙන් පසු නැවත වැඩ නවතා දමා තිබුණි. | බිම් මහලේ වැඩකටයුතු මෙම වසරේ අවසන් කිරීමට නියමිතය, ඉතිරි මහල් වල ඉදිකිරීම ආසියානු සංවර්ධන බැංකුණය යටතේ ලැබෙන ප්‍රතිපාදන වලින් නිම කිරීමට සැලසුම් කර ඇති බව. | ප්‍රතිපාදන සලසාගෙන ඉතිරි වැඩ නිම කරවා ගෙන අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතු ය. |

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (ආ) | බලංගොඩ මූලික රෝහලේ පස් මහල් රැඳී සිටීමේ කාමර ගොඩනැගිල්ල ඉදිකිරීමේ කර්මාන්තය රු.54,728,057 ක වැඩ වටිනාකමකට 2022 අප්‍රේල් 05 දිනට පෙර වැඩ අවසන් කිරීම සඳහා 2021 ජූනි 05 දින ගිවිසුම්ගතව තිබුණි. පසුව අවස්ථා කිහිපයකදී 2024 දෙසැම්බර් 15 දක්වා දින දීර්ඝ කිරීම් අනුමත කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එහි වැඩ අවසන් කර නොතිබුණි. 2025 අගෝස්තු 06 දින වන විට රු. 46,455,434 ක් වැය කර බිම් මහල හා පළමු මහල පමණක් වැඩ අවසන් කර තිබුණු අතර ඉතිරි මහල් සඳහා සැකිල්ල සහ වහලය පමණක් ඉදිකර තිබුණි. | මෙම ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ 2026 වසරේ සිට 2030 දක්වා ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහන වෙත ඇතුළත් කර අවසන් කිරීමට කටයුතු කරන බව. | සැලසුම් කර ඇති පරිදි ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ නිම කරවා ගෙන අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කළ යුතු ය. |

**1.5.7.4 අත්හැර දැමූ ව්‍යාපෘති**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් හේවායින්න සෞඛ්‍ය මධ්‍යස්ථානයේ දෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2022 වර්ෂය වන විට රු. මිලියන 13.7 ක් වැය කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඉඩමේ මායිම් නිරවුල් කර ගෙන නොතිබීම නිසා ගොඩනැගිල්ලේ ඉදිකිරීම් අතරමඟ නවතා දමා තිබුණි. | මෙම වසරේ ප්‍රතිපාදන මත ඉදිකිරීම් අවසන් කර ක්‍රියාකාරී මට්ටමට ගෙන ඒමේ හැකියාව ඇති බව. | ඉඩමේ මායිම් පිළිබඳ ගැටළුව නිරවුල් කර ඉදිකිරීම් අවසන් කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගෙන අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කළයුතු ය. |

**1.5.7.5 නිශ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සබරගමුව පළාත් ප්‍රධාන අමාත්‍යාංශය විසින් 2021 වර්ෂයේදී රු.මිලියන 6.4 ක් වැයකර රක්වාන, ගොඩකවෙල ප්‍රාදේශීය රෝහල් සඳහා විකිරණ අංශ ඉදිකර තිබුණි. එහෙත් එම අංශය සඳහා අවශ්‍ය විකිරණ ශිල්පීන් මේ දක්වා අනුයුක්ත කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් එම සියළු භෞතික සම්පත් නිෂ්කාර්යයව පැවතුණි. | ගොඩකවෙල රෝහල සඳහා ලබා දී ඇති උපකරණය අපහරණය කිරීමට නියමිත බව හා මේ වන විට කාර්යමණ්ඩලය සමාලෝචනය සිදුකර ඇති බැවින් නව සේවක සංඛ්‍යා ලැබෙන තෙක් මෙම උපකරණ තාවකාලිකව වෙනත් රෝහලකට මාරුකර හැරීමේ හැකියාව සොයා බලා වාර්තා කරන බව. | අදාළ උපකරණ නිෂ්කාර්යව නොතබා වෙනත් රෝහල්වලට මාරු කිරීමට හෝ අවශ්‍ය කාර්ය මණ්ඩල ඉල්ලා ගෙන වත්කම්වලින් ප්‍රයෝජන ගැනීමට කටයුතු කළයුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2021 වර්ෂයේ දී යුධ හමුදා ශ්‍රම දායකත්වයෙන් ස්ථාපිත කර තිබුණු කහවත්ත මූලික රෝහලේ දැඩිසත්කාර ඒකකය සඳහා ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් නොමැති වීම හා අවශ්‍ය උපකරණ (Patient Monitor, Infusion Pump) නොලැබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එහි කටයුතු ආරම්භකර නොතිබුණි. එම හේතුවෙන් 2021 වර්ෂයේ දී ලද දැඩිසත්කාර (ICU) ඇඳන් 08 ක් සහ Ventilator 04 ක් 2025 දෙසැම්බර් 31 දින වන විටත් නිෂ්කාර්යයව පැවතුණි. | නව සේවක සංඛ්‍යා අනුමතවී නව බඳවා ගැනීම් සිදුකළ විට මෙම ඒකකය ක්‍රියාකාරී තත්වයට ගෙන ඒමේ හැකියාව ඇති බව. | නව සේවක සංඛ්‍යාව අනුමත කරගැනීම හා බඳවා ගැනීම් සඳහා අවශ්‍ය පියවරයන් ගෙන දැඩි සත්කාර ඒකකය ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කඩිනම් කළ යුතු ය. |

### 1.5.7.6 කාර්ය මණ්ඩල පරිපාලනය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| 2025 දෙසැම්බර් 31 දිනට සබරගමුව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ තනතුරු 69 ක නිලධාරීන් 701 දෙනෙකු පුරප්පාඩු වී පැවතුණු අතර, කහවත්ත මූලික රෝහලේ තත්‍ය කාර්යය මණ්ඩලය තුළ ඇතුළත් තනතුරු 03 ක් අනුමත කර ගෙන නොතිබුණි. | රේඛීය අමාත්‍යාංශය මගින් පුරප්පාඩු කැඳවීම සිදු කරන අතර බඳවා ගනු ලබන ප්‍රමාණය අනුව මෙම පළාත සඳහා නිලධාරීන් අනුයුක්ත කිරීම සිදු කරනු ලබන බව, අභ්‍යන්තර උසස්වීම් මගින් සබරගමුව පළාත් සභාව මගින් සිදු කරනු ලබන බඳවා ගැනීම් සඳහා අවශ්‍ය තොරතුරු කැඳවන අවස්ථා වලදී පුරප්පාඩු සම්බන්ධ තොරතුරු ලබා දීම සිදු කරන බව. | අත්‍යවශ්‍ය තනතුරුවල පවතින පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට හා අනුමත නොවන තනතුරු අනුමත කරවා ගැනීමට කටයුතු කළයුතු ය. |

### 1.5.7.7 පාරිසරික හා සමාජ වගකීම් ඉටු කිරීම

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බලංගොඩ මූලික රෝහලේ මල අපවහන පද්ධතිය නිරන්තර අවහිර වීම් වලට ලක් වීම හේතුවෙන්, ආසාධිත ජලය හා මල අපවහන පද්ධතියේ ජලය ගඟට හා පරිසරයට එකතු වීමෙන් පාරිසරික හානියක් සිදු වෙමින් පැවතුණි. අප ජලය පිරිපහදු ඒකක ස්ථාපිත කර දෙන ලෙස බලංගොඩ, මාවනැල්ල සහ කරවනැල්ල රෝහල් විසින් ඉල්ලීම් කර ඒ සඳහා පළාත් විශේෂ සංවර්ධන ප්‍රදාන යටතේ 2024 වර්ෂයේදී හා 2025 වර්ෂයේදි පිළිවෙලින් රු.මිලියන. 15 ක් හා රු.මිලියන 30 ක් ප්‍රතිපාදන වෙන් කර තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම ව්‍යාපෘති ආරම්භකර නොතිබුණි. | ජාතික ජල සම්පාදන සහ ජලප්‍රවාහන මණ්ඩලයේ නිලධාරීන් අවශ්‍ය විශේෂඥ සේවාව ලබා දීම සඳහා මුළු ඇස්තමේන්තුවෙන් සියයට 11.5 ප්‍රතිශතයක් ඉල්ලා සිටින ලදී. එම ප්‍රමාණය පළාත් සභාවට දැරිය හැකි ප්‍රමාණයට වඩා වැඩි ප්‍රතිශතයක් බැවින් ඉදිකිරීම් ආරම්භ නොකරන ලදී. | මල අපවහන පද්ධති විධිමත්ව නඩත්තු කිරීමට හා අප ජල පිරිපහදු ඒකක ස්ථාපිත කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | | පසුව පරිසර ඇමතිතුමා සමග සාකච්ඡා කර අමාත්‍යමණ්ඩල තීරණයක් ගැනීමට එකඟත්වය පලකර ඇති බව.<br>මෙම කාරණය දිගින් දිගටම විසඳුමක් නොමැතිව පවතින බැවින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලියාපදිංචි විෂය පිළිබඳ විශේෂඥ නිලධාරීන්ගේ ලේඛනයේ සඳහන් අයගෙන් තාක්ෂණික දැනුම ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු මේ වන විට කරමින් පවතින බව. | |
| (ආ) | කහවත්ත මූලික රෝහලේ වාට්ටු/ ඒකකවලින් ඉවත් කරනු ලබන කුඩා වීදුරු කුප්පි බැහැර කිරීමේ ක්‍රමවේදයක් නොතිබීම හා Incinerator යන්ත්‍රය මඟින් දහනය කරනු ලබන අපද්‍රව්‍යවල ශේෂවන අලු දැමීමට ප්‍රමාණවත් වලවල් නොතිබීම හේතුවෙන් මෘත ශරීරාගාරය අසල හා Incinerator යන්ත්‍රය ඉදිරිපිට ඒවා ගොඩගසා තිබුණු අතර, රෝහල් සහ ප්‍රාථමික වෛද්‍ය ප්‍රතිකාර ඒකකවලින් කහවත්ත මූලික රෝහල වෙත රැගෙන එන ශල්‍ය අපද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා ප්‍රමාණවත් ඉඩ පහසුකම් නොතිබීම නිසා ගෑස් ටැංකි ගබඩා කරන ඉඩ ඒ සඳහා භාවිතා කර තිබුණි. තවද, කසළ දහනය සඳහා නිශ්චිත සේවකයෙකු යොදවා නොතිබුණි. | ඉදිරියේදී කහවත්ත ප්‍රාදේශීය සභාව සතු ස්ථිර භූමියක් ලබා ගැනීමට සැලසුම් කර ඇති බැවින් සභාව සමග ඒකාබද්ධව කටයුතු කිරීමට සැලසුම් කර ඇති බව. | ශල්‍ය අපද්‍රව්‍ය හා අනෙකුත් කසළ බැහැර කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කළ යුතු ය. |

**1.5.8 ශීර්ෂය - 812- පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව**

**1.5.8.1 පින්නවල ආයුර්වේද පංචකර්ම ඒකකය**

**1.5.8.1.1 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සබරගමුව පළාත් ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ 2025 සැප්තැම්බර් 26 දිනැති ලිපිය මගින් පංචකර්ම ඒකකයේ පැරණි ගොඩනැගිල්ලේ වහලය අලුත්වැඩියා කිරීම සහ පින්තාරු කිරීම සඳහා රු.8,387,525ක ප්‍රතිපාදන ලබා දී තිබුණ ද, 2026 මැයි වන විටත් එහි කටයුතු ආරම්භ කර නොතිබුණු අතර ගොඩනැගිල්ල නිෂ්කාර්යව පැවතුණි. | පංචකර්ම ආයතනය පවතින ඉඩමේ අයිතිය පිළිබද ප්‍රාදේශීය සභාව සමග පැවති ගැටලුකාරී තත්වය හේතු කොට ගෙන එම සංවර්ධන කටයුතු 2025 වසරේ සිදු කිරීමට නොහැකි වූ බව. | ඉඩමේ අයිතිය නිරවුල් කරගෙන සංවර්ධන කටයුතු කඩිනම් කර වත්කම් වලින් උපරිම ප්‍රයෝජනය ගැනීමට කටයුතු කළයුතු ය. |

**1.5.8.1.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පින්නවල පංචකර්ම ඒකකය සහ පින්නවල ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාව පිහිටි භූමිය රඹුක්කන ප්‍රාදේශීය සභාව වෙතින් බදු පදනම මත ලබාගෙන තිබුණද, නියමිත පරිදි බදු මුදල් නොගෙවීම හේතුවෙන් හිඟ බිම් බදු කුලිය ලෙස රු.3,414,000 ක් ගෙවිය යුතු පැවැතිණි. | ගෙවිය යුතු බදු මුදල් සම්බන්ධයෙන් ගැටලු සහගත තත්ත්වයක් ඇතිවීම හේතුවෙන් ආණ්ඩුකාරතුමිය, පළාත් පාලන කොමසාරිස් හා රඹුක්කන ප්‍රාදේශීය සභාවේ සභාපති සමඟ සාකච්ඡා කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව. | හිඟ බිම් බදු කුලී නිරවුල් කිරීමට කටයුතු කළයුතු ය. |

**1.5.9 ශීර්ෂය - 813- පළාත් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව**

**1.5.9.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට පළාත තුළ ලියාපදිංචි සමූපකාර සමිති 944 කින් අක්‍රිය සමිති 280 ක් හා ඈවර කරමින් පවතින සමිති 112 ක් පැවතුණි. ඒ අනුව ලියාපදිංචි සමිති සංඛ්‍යාවෙන් සියයට 42ක් | මෙම සමිති දීර්ඝ කාලයක් අක්‍රියව පැවතියද නැවත ප්‍රතිසංවිධානය කළයුතු බවට සාමාජික ඉල්ලීම් ලැබී නැති බව හා විශාල සමිති සංඛ්‍යාවක් අධීක්ෂණය කිරීම සඳහා ප්‍රමාණවත් | ලියාපදිංචි සමිති සක්‍රියව පවත්වාගෙන යාමට අවශ්‍ය සහාය හා අධීක්ෂණය ප්‍රමාණවත් පරිදි |

| | | | |
|---|---|---|---|
| | අක්‍රිය හා ඇවර තත්ත්වයේ පැවතීමෙන්, සමුපකාර සමිති සංවර්ධනය කිරීම, පාලනය කිරීම, උපදේශාත්මක සේවාවන් සැපයීම, සමිති පරීක්ෂා කිරීම හා ගිණුම් මෙහෙයවීම සම්බන්ධයෙන් වන දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ප්‍රමාණවත් පරිදි ඉටු වී නොතිබුණි. | නිලධාරීන් සංඛ්‍යාවක් (නිලධාරීන් 51) නොමැතිවීම ද යම් තරමකින් බලපා ඇති බව. | ලබාදීමට කටයුතු කළ යුතු ය. |
| (ආ) | සමුපකාර සංවර්ධන අරමුදල මඟින් 2002 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වූ කාලසීමාව තුළ සමුපකාර සමිති 03 ක් වෙත අවස්ථා 05 කදී ලබා දී තිබුණු එකතුව රු.5,150,000 ක ණය ආපසු ගෙවීම අදාළ සමිති විසින් පැහැර හැර තිබුණි. ඒ අනුව, සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට පොළිය ද ඇතුළත්ව රු.3,616,793 ක් අයවිය යුතුව පැවතුණි. | සී/ස බඹරබොටුව පිටිගල සණස සමිතියේ ණය ගෙවා අවසන් නොකළහොත් ප්‍රඥප්තිය ප්‍රකාරව කටයුතු කිරීමෙන් ද සී /ස රඹුක්කන මාවනැල්ල කිරි නිපදවන්නන්ගේ සමුපකාර සමිතියේ ඇවර කටයුතු මඟින් ද අය කර ගන්නා අතර සී/ස බුලත්කොහුපිටිය වි.සේ.ස. සමිතිය ලිඛිත දැනුවත් කළ ද 2025 මැයි වන විටත් ගෙවා නොමැත. | හිඟ ණයශේෂ අය කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනම් කළ යුතු ය. |

## 1.5.10 ශීර්ෂය - 814- පළාත් පාලන දෙපාර්තමේන්තුව

### 1.5.10.1 නීතිරීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම්

| | නීතිරීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2023 අංක 09 දරන දූෂණ විරෝධී පනතේ 80(1) වගන්තිය | 2025 වර්ෂයේ දී සබරගමුව පළාතේ පළාත් පාලන ආයතන 29 සඳහා තේරී පත් වූ සභිකයින් 833 ක් අතරින් සභිකයින් 432 ක් 2026 මැයි 15 දින වන විටත් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි. | 2026 මැයි 15 දින වන විට වැඩි වූ සභිකයන් 833 ගෙන් සභිකයන් 401 දෙනෙකු වත්කම් බැරකම් ප්‍රකාශ මෙම කාර්යාලය වෙත ලබාදී ඇති බව | පනත අනුව කටයුතු කර වත්කම් බැරකම් ප්‍රකාශ ලබා ගැනීමට කටයුතු කළ යුතු ය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVII වැනි පරිච්ඡේදයේ 13.2 ඡේදය | පළාත් පාලන කොමසාරිස් විසින් 2024 හා 2025 වර්ෂවල මූලික විමර්ශන 33 ක් සඳහා පත්කරන ලද මූලික විමර්ශන නිලධාරීන් විසින් 2026 මැයි වන විටත් පරීක්ෂණ අවසන් කර වාර්තා ඉදිරිපත් කර නොතිබුණු අතර, සුදුසු පරිදි කාලය දීර්ඝ කිරීම් ද සිදුකර නොතිබුණි. | සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාලවල ප්‍රජා සංවර්ධන නිලධාරීන් සහ විමර්ශන නිලධාරීන් සංඛ්‍යාව සීමිත වීමත්, මොවුන් කාර්යාලයට ලැබෙන පෙත්සම් පරීක්ෂණ, කාර්යාල අධීක්ෂණය, කාර්ය සාධන තරඟාවලියේ විනිශ්චය | මූලික විමර්ශන නියමිත කාලසීමාව තුළ නිම කරවා ගෙන ඒ අනුව අදාළ ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතු ය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | කටයුතුවල නිරත වීම, මූලික විමර්ශන යන සියලු රාජකාරී සියල්ල සිදු කළ යුතු හේතුවෙන් විමර්ශන කටයුතු ප්‍රමාද වූ බව. | |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 104(4) | පළාත් පාලන කොමසාරිස් විසින් 2024 හා 2025 වර්ෂවල හානිපාඩු පරීක්ෂණ 21 ක් සඳහා පත්කර තිබුණු නිලධාරීන් විසින් 2026 මැයි වන විටත් එම පරීක්ෂණ අවසන් කර වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | විමර්ශන නිලධාරීන් සහ ප්‍රජා සංවර්ධන නිලධාරීන්ගේ හිඟතාවය නිසා මෙම කටයුතු ප්‍රමාද වූ බව. | මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව සිදුකරන පරීක්ෂණ නියමිත කාලසීමාව තුළ නිම කරවාගෙන ඒ අනුව අදාළ කටයුතු කළ යුතු ය. |

**1.5.10.2 ක්‍රියාකාරී සැලැස්ම**

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| පළාත් පාලන දෙපාර්තමේන්තුවේ 2025 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව පළාත් පාලන ආයතනවල පවතින නිශ්කාර්යය වත්කම්, අවශ්‍යතාවය පවතින ආයතන හඳුනාගෙන හුවමාරු කිරීමට හා සෑම පළාත් පාලන ආයතනයකම අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා පස් අවුරුදු සැලැස්ම සකස් කිරීමට අවශ්‍ය මඟ පෙන්වීම හා අධීක්ෂණ ලබාදීමට සැලසුම් කර තිබුණි. එහෙත් පළාත් පාලන ආයතන 10ක වර්ෂ 01ත් 13ත් අතර කාලයක් නිශ්කාර්යයව පවතින වාහන හා යන්ත්‍රෝපකරණ කිසිවක් සමාලෝචිත වර්ෂය තුළ එලෙස හුවමාරු කර නොතිබුණු අතර, සබරගමුව පළාත තුළ පවතින පළාත් පාලන ආයතන 29 විසින්ම කසල කළමනාකරණය සඳහා පස් අවුරුදු සැලැස්ම සකස් කර නොතිබුණි | 2025 වර්ෂයට අදාළව සබරගමුව පළාත තුළ පවතින පළාත් පාලන ආයතන 29 ටම අදාළව පළාත් පස් අවුරුදු සැලැස්මේ මූලික කෙටුම්පත මේ වන විට සකස් කර ඇති බවත්, එහි තවදුරටත් නිවැරදි කළ යුතු කරුණු පිළිබඳව අධ්‍යයනය කර තීරණ ගැනීමට නියමිත බව. | නිශ්කාර්ය වත්කම් හා කසළ කළමනාකරණය සඳහා පළාත් පාලන ආයතනවලට අවශ්‍ය මඟපෙන්වීම හා අධීක්ෂණය ප්‍රමාණවත් පරිදි ලබා දී පස් අවුරුදු සැලැස්ම සකස් කර ගැනීමට කටයුතු කළයුතු ය. |

## 1.5.11 ශීර්ෂය- 820- පළාත් මාර්ග සංවර්ධනය,ග්‍රාමීය යටිතල පහසුකම් , සංචාරක සහ ක්‍රීඩා හා යෞවන කටයුතු පළාත් අමාත්‍යාංශය

### 1.5.11.1 කාර්ය සාධනය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| සංචාරක අංශයේ වාර්ෂික සංවර්ධන සැලැස්මට ඇතුළත් කිරීමට පෙර ව්‍යාපෘති ක්‍රියාත්මක කරන පරිශ්‍ර/භූමිය අයත් ආයතන වෙතින් අදාළ අනුමැතීන් ලබා ගැනීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දී රු. 54,500,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණු ව්‍යාපෘතිය 08 ක් ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි. | දේශපාලන අධිකාරිය හා රාජ්‍ය ආයතන සමඟ ඒකාබද්ධව ක්ෂේත්‍ර පරීක්ෂා සිදු කර වාචික එකඟතා මත වාර්ෂික සංචාරක සංවර්ධන සැලැස්ම සඳහා එම යෝජනා ඇතුළත් කළ ද ලිඛිත එකඟතා ලබා ගැනීමේ දී අනුමැතිය නොලැබීම නිසා ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බව. | සංවර්ධන සැලැස්මට ඇතුළත් කිරීමට පෙර ව්‍යාපෘති ක්‍රියාත්මක කරන පරිශ්‍ර/භූමිය අයත් ආයතන වෙතින් විධිමත් අනුමැතිය ලබාගැනීමට කටයුතු කළ යුතු ය. |

### 1.5.11.2 කළමනාකරණ දුර්වලතා

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2016 හා 2017 වර්ෂයන්හිදී පළාත් මාර්ග අමාත්‍යාංශ ප්‍රතිපාදන මත කොළොන්න ප්‍රාදේශීය සභාවේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කර තිබුණු ක්‍රීඩා පිටි සංවර්ධන ව්‍යාපෘති 21 ක ගෙවීම් කරන ලද වැඩ විෂයයක් මගින් ආවරණය වී තිබුණු අට්ටි ගසන ලද පස් ඇතිරීම අතිරේක වැඩ විෂයයක් ලෙසද ඇතුළත් කර ඝන මීටර් 38,872 ක් වෙනුවෙන් එකතුව රු.5,928,010 ක් අධි ඇස්තමේන්තුගත කර වැඩිපුර ගෙවා තිබුණද සමාලෝචිත වර්ෂය දක්වාම එම වැඩියෙන් ගෙවීම් අයකර ගැනීමට සහ වගකිව යුතු නිලධාරීන් සම්බන්ධ විනය කටයුතු අවසන් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙයට අදාළ විනය පරීක්ෂණ කටයුතු ප්‍රධාන ලේකම් කාර්යාලය මඟින් සිදු කරනු ලබයි.එම පරීක්ෂණ කටයුතු අවසන් කර නොමැති බව ප්‍රධාන ලේකම් කාර්යාලය දන්වා ඇති බව. | විනය පරීක්ෂණ කටයුතු කඩිනමින් අවසන් කර වැඩිපුර ගෙවීම් අයකර ගතයුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පළාත් මාර්ග අමාත්‍යාංශය විසින් 2017 වර්ෂයේදී ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව මගින් ඉටු කළ ව්‍යාපෘති වෙනුවෙන් රු. මිලියන 17.87 ක් සාවද්‍ය ලෙස ගෙවා තිබීම හා ව්‍යාපෘති 03 ක් සඳහා රු. මිලියන 4.16 ක් නිෂ්කාර්ය ලෙස වියදම් කිරීම සම්බන්ධයෙන් විනය කටයුතු අවසන් කිරීමට හා සාවද්‍ය ගෙවීම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙයට අදාළ විනය පරීක්ෂණ කටයුතු ප්‍රධාන ලේකම් කාර්යාලය මඟින් සිදු කරනු ලබන අතර එම පරීක්ෂණ කටයුතු අවසන් කර නොමැති බව. | විනය පරීක්ෂණ කටයුතු අවසන් කරවා ගෙන සාවද්‍ය ගෙවීම් අයකර ගතයුතු ය. |

**1.5.12 ශීර්ෂය - 830- සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක , ග්‍රාම සංවර්ධන සහ ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය.**

**1.5.12.1 පළාත් සමාජ සේවා අරමුදල**

**1.5.12.1.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| සමාජ සේවා අරමුදල පිහිටුවීම පිළිබඳ ප්‍රඥප්තියේ 24 වන රෙගුලාසිය අනුව වෙනත් කිසිඳු ආධාර යෝජනා ක්‍රමයකින් ආධාර හෝ සහනාධාර ලැබී නැති ඉතාමත් අන්ත දුගී තත්ත්වයේ සිටින පවුල්වල පුද්ගලයින්ගේ යහපත සඳහා මෙම ප්‍රඥප්තිය මඟින් සලසා ඇති කවර ක්‍රමයක හෝ ආධාර හෝ සහනාධාර සැපයිය හැකි වුවත්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 06 ක පමණක් ආධාර ලබා දීමට සුදුසු පුද්ගලයින් හඳුනාගැනීමේ සමීක්ෂණ සිදු කර තිබුණි. තවද, සමාලෝචිත වර්ෂයේ දී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 03 ක ප්‍රතිලාභීන් 09 දෙනෙකුට වෛද්‍ය ආධාර හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක එක් ප්‍රතිලාභියෙකු සඳහා නිවාස ආධාරයක් පමණක් ලබා දී තිබුණු අතර, වෙනත් ආධාර හෝ සහනාධාර කිසිවක් ගෙවා නොතිබුණි. | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමෙන් නිරන්තර දැනුවත් කිරීම් සිදු කළ ද අවශ්‍යතාවය ඇති අඩු ආදායම්ලාභී අයදුම්පත් ඉදිරිපත් කිරීම දුර්වල මට්ටමක පවතින බව. | සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම සිටින පළාත් සමාජසේවා නිලධාරීන් මඟින් ප්‍රතිලාභීන් හඳුනාගැනීම හා පසු විපරම් කිරීම සිදු කළ යුතු ය. |

**1.5.13 ශීර්ෂය - 840- අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු පළාත් අමාත්‍යාංශය.**

**1.5.13.1 කාර්ය සාධනය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| පළාතේ පාසල්වල භෞතික සම්පත් සංවර්ධනය සඳහා පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2025 වර්ෂයේ දී රු.1,689,773,406 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂය හා ඉදිරි වර්ෂ කිහිපය තුළ එක් එක් පාසල සඳහා ලබා දිය යුතු භෞතික සම්පත් හා ඒවායේ ප්‍රමුඛතාවය විධිමත්ව අධ්‍යයනය කර සකස් කළ සැලැස්මක් හා දත්ත පද්ධතියක් අමාත්‍යාංශය සතුව නොතිබුණි. එක් එක් පාසලෙන් ලැබෙන ඉල්ලීම් පදනම් කර ගනිමින් ප්‍රතිපාදන වෙන් කිරීමට කටයුතු කර තිබීමෙන් පළාත තුළ පවතින පාසල් අතර, භෞතික සම්පත් බෙදියාමේ විෂමතාවයක් පැවැතුණි. | සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීමටද මේ වන විට යම් ප්‍රමාණයකට තොරතුරු තාක්ෂණය යොදා ගනිමින් සිටින අතර පාසල් වල භෞතික පහසුකම් වලට අදාළ තොරතුරු පාසල් මට්ටමින් ඇතුළත් කිරීමට සිප්තතු තොරතුරු පද්ධතිය වැඩිදියුණු කිරීම මේ වන විට ආරම්භ කර ඇති බව. | දත්ත පද්ධතිය කඩිනමින් සකස් කර පාසල් සඳහා භෞතික සම්පත් සාධාරණව බෙදී යන ලෙස ප්‍රතිපාදන වෙන් කිරීමට කටයුතු කළ යුතු ය. |

**1.5.13.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සබරගමුව පළාත් හිටපු අධ්‍යාපන අමාත්‍යවරයාගේ කාර්ය මණ්ඩලය භාවිතා කළ කැබ් රථය 2017 ජුනි 12 දින අනතුරකට ලක්ව තිබුණු නමුත්, පළාත් මූල්‍ය රීති 54.6 ප්‍රකාරව අනතුර සිදු වූ දින සිට මාස 3 ක් ඇතුළත ලබා දිය යුතු පූර්ණ වාර්තාව 2025 දෙසැම්බර් 31 දින වන විටත් ලබා දී නොතිබුණි. එසේම, කැබ් රථය වසර 05 කුත් මාස 08 කට පසු එනම් 2023 නොවැම්බර් 16 දින අධ්‍යාපන අමාත්‍යාංශය වෙත රැගෙනවිත් තිබුණ ද, අලුත්වැඩියාව නිසි පරිදි සිදුකර නොතිබීමෙන් පළාත් අරමුදලට රු.මිලියන 3.89 ක පාඩුවක් සිදුව තිබුණි. එහෙත්, ඒ | මු.රෙ.104 අනුව පරීක්ෂණ සිදු කිරීමට 2025 සැප්තැම්බර් 19 දින කමිටුවක් පත්කර ඇති බව. | සිදුව ඇති පාඩුව සම්බන්ධයෙන් විමර්ශනයක් සිදුකර වගකිව යුතු පාර්ශව හඳුනා ගෙන රජයට සිදු වූ පාඩුව පියවා ගැනීමට කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | සඳහා වගකිව යුතු පාර්ශව හඳුනාගෙන අලාභ අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) | පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් විමර්ශන කටයුතු අවසන් කිරිම සඳහා දින 14 සිට දින 60 දක්වා කාල සීමාවක් ලබා දී තිබුණු මූලික විමර්ශන 10 ක කටයුතු සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අවසන් කර නොතිබුණු අතර, ප්‍රමාද කාලය මාස 01 සිට අවුරුදු 02 මාස 8 දක්වා විය. එසේ ම, 2024 හා 2025 වර්ෂයන් තුළ ලැබී තිබුණු පැමිණිලි 465 කින් පැමිණිලි 359 ක් පරීක්ෂණ පවත්වා වාර්තා ඉදිරිපත් කරන ලෙස දන්වමින් කලාප කාර්යාල වෙත යොමුකර තිබුණ ද , ඒ සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව පසු විපරම් කර නොතිබුණි. | මූලික විමර්ශන කටයුතු සිදු කරමින් පවතින බව. | මූලික විමර්ශන නිශ්චිත කාලසීමාවක් තුළ නිම කරවා ගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම කඩිනම් කළ යුතු ය. |

**1.5.13.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දි රත්නපුර කලාපයට හා නිවිතිගල කලාපයට අයත් පාසල් 19 ක රු.5,476,646 ක වියදමින් සිදුකරන ලද අලුත්වැඩියා කර්මාන්තවල දී රු.939,471 ක් වැඩිපුර ගෙවා තිබුණි. | අඩුපාඩු සම්පූර්ණ කරන තෙක් රැඳවුම් නිදහස් නොකිරීමටත් ගෙවීම් සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීමටත් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් කටයුතු කරන බව. | බිල්පත් සහතික කිරීමේ ක්‍රියාවලිය වඩා විධිමත් කිරීමට හා වැඩිපුර ගෙවීම් ආපසු අයකර ගැනීමට කටයුතු කළ යුතු ය. |

**1.5.13.4 සබරගමුව පූර්ව ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරිය**

**1.5.13.4.1 කාර්ය සාධනය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| සබරගමුව පළාත තුළ පවතින සියළුම පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම, | 2026 වර්ෂයේදී සියළු පෙර පාසල් නැවත දැනුවත් කර ලියාපදිංචිය යාවත්කාලීන කිරීම සඳහා ඉදිරියේදී | ලියාපදිංචි කිරීම සඳහා සම්පූර්ණ කළයුතු සියළු නිර්ණායක |

| | | |
|---|---|---|
| නියාමනය හා අධීක්ෂණය අධිකාරියේ ප්‍රධාන කාර්යභාරය වුවද, පෙර පාසල් නාම ලේඛනයට අනුව 2025 දෙසැම්බර් 31 දිනට පැවති පෙර පාසල් 1549 කින් පෙර පාසල් 489 ක් අවශ්‍ය නිර්ණායක සම්පූර්ණ නොකිරීමෙන් සමාලෝචිත වර්ෂය සඳහා ලියාපදිංචිය යාවත්කාලීන කර නොතිබුණි. | විශේෂ අවධානය යොමු කරනු ලබන බව. | සම්පූර්ණ කරවා ගෙන පෙර පාසල් සියල්ල ලියාපදිංචි කිරීම සඳහා ක්‍රමවත් වැඩ සටහනක් ක්‍රියාත්මක කළ යුතු ය. |

**1.5.13.4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| වසර 03 කට වඩා පැරණි රු.543,650 ක ණය ශේෂය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකරගෙන නොතිබුණි. | දැනට වාරික වශයෙන් මුදල් ගෙවීම සිදු කරන බව. | ණය ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළයුතු ය. |

**1.5.14 ශීර්ෂය 841- පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**1.5.14.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| කලාප අධ්‍යාපන කාර්යාල 02 ක් වෙත විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් 2024 හා 2025 වර්ෂවල ලැබී තිබුණු රු.2,260,453 ක් හා කලාප කාර්යාල 03 කට අදාළව 2023 වර්ෂයේ සිට බැංකු ගිණුම් අංක වැරදීම හේතුවෙන් බැංකුවෙන් ප්‍රතික්ෂේප වූ රු.1,077,000 ක ශිෂ්‍යාධාර මුදල් පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. | ශිෂ්‍යාධාර දත්ත පද්ධතිය අක්‍රියව ඇති බැවින්, එය යථා තත්ත්වයට පත් වූ පසු එම මුදල් ද අදාළ ශිෂ්‍යයන් වෙත ගෙවීමට හා තැන්පතු නිරවුල් කිරීමට කටයුතු කරන බව. | ශිෂ්‍යාධාර දත්ත පද්ධතිය කඩිනමින් ක්‍රියාකාරී තත්ත්වයට පත්කර ශිෂ්‍යාධාර මුදල් ගෙවීම් කිරීමට හා තැන්පතු නිරවුල් කිරීමට කටයුතු කළ යුතු ය. |

**1.5.14.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නිවිතිගල, රත්නපුර, ඇඹිලිපිටිය හා බලංගොඩ කලාපවල පාසල් 48 ක සිදුව තිබුනු හානි /පාඩු 48 ක් සම්බන්ධයෙන් ඒවා සිදු වී මාස 04 සිට අවුරුදු 25 දක්වා කාලයක් ගත වී තිබුණ ද, පළාත් මුල්‍ය රීති 54.1 ප්‍රකාරව කටයුතු කර අලාභ අයකර ගැනීම හෝ කපා හැරීම සිදු කර නොතිබුණි. | අලාභහානි 48 සම්බන්ධයෙන් පරීක්ෂණ ආරම්භ කර කටයුතු කරමින් පවතින බව. | හානි හා පාඩු සම්බන්ධයෙන් මුල්‍ය රීති ප්‍රකාරව සිදුකරන පරීක්ෂණ අප්‍රමාදව සිදුකර වගකිවයුතු පාර්ශව හඳුනාගැනීමට හා අලාභ පියවා ගැනීමට කටයුතු කළ යුතු ය. |
| (ආ) | ඇඹිලිපිටිය කලාපයේ පාසල්වල 2019 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා කාලය තුළ සිදු ව තිබුණු හානි පාඩු 07 ක් සඳහා වගකිව යුතු ලෙස හඳුනාගෙන තිබුණු නිලධාරීන් 15 දෙනෙකුගේ වැටුපෙන් රු.940,403ක් අයකළ යුතු බවට පළාත් මුල්‍ය රීති 54.1.6 ප්‍රකාරව තීරණය කර තිබුණ ද, ඉන් රු.588,199 ක් 2026 ජුනි වන විටත් අය කරගෙන නොතිබුණි. | ඉදිරියේදී අය කිරීමට කටයුතු කරන බව. | නිර්දේශ ප්‍රකාරව කඩිනමින් අයකර ගැනීම් සිදු කිරීමට කටයුතු කළ යුතු ය. |

**1.5.14.3 වාහන උපයෝජනය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් අළුත්වැඩියා කටයුතු සඳහා සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරියට 2024 මැයි 21 දින යොමුකර තිබුණු වාහන 02 ක් සඳහා එම ආයතනය ඉදිරිපත් කර තිබුණු මිල ගණන්වලට අළුත්වැඩියා කිරීම ආර්ථික වශයෙන් ඵලදායි වන්නේ ද යන්න පිළිබඳව නිර්දේශ සහිත වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා තිදෙනෙකුගෙන් සමන්විත පරීක්ෂණ කමිටුවක් 2025 ජුනි 02 දින පත්කර තිබුණු නමුත්, 2026 මැයි 08 දින වන විටත් ඒ පිළිබඳ පරීක්ෂා කර බලා වාර්තාවක් | කැබ් රථ අලුත්වැඩියා කිරීම ආර්ථික වශයෙන් ඵලදායි වන්නේද යන්න තීරණය කිරීමට පත් කර ඇති කමිටු තීරණය ලද පසු ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව. 2018-2022 කාලපරිච්ඡේදයට අදාළ වාහන 04 න් වාහන 03 ක අලුත්වැඩියාවන් සිදු කරන බව හා අනෙක් වාහනය අලුත්වැඩියා කිරීම ආර්ථික වශයෙන් ඵලදායි නොවන බව. | වාහනවල අලුත්වැඩියා හා නඩත්තු කටයුතු අප්‍රමාදව සිදුකළ යුතු අතර, අළුත්වැඩියා කිරීම සිදුකළ නොහැකි නම් එම වාහන අපහරණය කිරීමට කටයුතු කළයුතු ය. |

| | | | |
|---|---|---|---|
| | ඉදිරිපත් කර නොතිබුණි. එමෙන් ම, අළුත්වැඩියාව සඳහා 2018 - 2022 කාලපරිච්ඡේදය තුළ දී එම අධිකාරිය වෙත භාර දෙන ලද වාහන 04 ක් 2026 අගෝස්තු වන විටත් අළුත්වැඩියා කර නොතිබුණි. එම නිසා අදාළ වාහන දිගින් දිගටම එක් ස්ථානයක ගාල් කර පැවතීමෙන් වෙනත් දෝෂයන් ඇතිවීමේ අවධානමක් ද පැවතුණි. | | |

**1.5.14.4 අධ්‍යාපන කාර්ය මණ්ඩල ඌනතා හා අතිරික්තතා**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට සබරගමුව පළාතේ අනුමත ගුරු කාර්යය මණ්ඩලය 24,401 ක් වූ අතර, තථ්‍ය කාර්යය මණ්ඩලය 20,407 ක් වූයෙන්, ගුරුවරු 3,994 ක ඌනතාවයක් විය. ඒ අනුව පළාතේ සියලුම කළාපයන්හි ගුරු කාර්ය මණ්ඩල ඌනතාවයක් පැවතුණි. | 2026 වර්ෂයේ දී ගුරුවරුන් 1997 ක් බඳවා ගැනීමට කැබිනට් අනුමැතිය ලැබී ඇති බව. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට හා ගුරු තුලනයක් පවත්වා ගැනීමට කටයුතු කළ යුතු ය. |
| (ආ) | සබරගමුව පළාතේ විදුහල්පති , නියෝජ්‍ය විදුහල්පති හා සහකාර විදුහල්පති තනතුරු සඳහා අනුමත කාර්ය මණ්ඩලය 1453 ක් වූ අතර, තථ්‍ය කාර්යය මණ්ඩලය 783 ක් වූයෙන් ඌනතාවය 670 ක් විය. | පිළිගන්නා බව. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට හා ගුරු තුලනයක් පවත්වා ගැනීමට කටයුතු කළ යුතු ය. |
| (ඇ) | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 27 ක ඌනතාවයක් පැවති අතර, සංවර්ධන නිලධාරි අතිරික්තය හේතුවෙන් ද්විතියික මට්ටමේ තනතුරු 1805 ක අතිරික්තයක් පැවතුණි. | අතිරික්තය හා ඌනතා කාර්තුමය වශයෙන් හා අවශ්‍යතාවය පරිදි අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමුකර ඇති බව. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට හා අතිරික්තතා තුලනය කර ගැනීමට කටයුතු කළ යුතු ය. |

## 1.5.15 ශීර්ෂය 850- ඉඩම්, පළාත් වාරි මාර්ග , කෘෂිකර්ම , සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ධීවර පළාත් අමාත්‍යාංශය

### 1.5.15.1 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
| --- | --- | --- |
| මුරුත කැටිය වැව ධීවර මාර්ගය සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ එක් වැඩ විෂයයක් සඳහා 2024 දෙවන අර්ධ වර්ෂයට අදාළ පළාත් මාර්ග රේට (HSR) වෙනුවට 2024 පළමු අර්ධ වර්ෂයේ මාර්ග රේට සදොස් ලෙස යොදා ගෙන තිබීමෙන් රු.353,220 ක් වැඩිපුර ගෙවා තිබුණි. | කාර්මික නිලධාරි හට උක්ත කර්මාන්තය සඳහා ඇස්තමේන්තු සකස් කරන අවස්ථාවේ දී නව රේට පිළිබඳ වෙනස හඳුනාගැනීමට නොහැකි වීම නිසා වැඩ විෂය අංක 4 Preparing stock piling premix වැඩය සඳහා 2024 පළමු අර්ධ වර්ෂයේ ගාස්තුව ඇතුළත් කර ඇති බව. | වැඩිපුර ගෙවීම් කොන්ත්‍රාත්කරුගෙන් හෝ අනුමත කළ නිලධාරියාගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතු ය. |

### 1.5.15.2 ප්‍රමාද වූ ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
| --- | --- | --- |
| ඉඩම්, පළාත් වාරිමාර්ග, කෘෂිකර්ම, සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු අමාත්‍යාංශය විසින් ශක්‍යතා අධ්‍යනයකින් තොරව ව්‍යාපෘති සැලසුම් කර තිබීම හේතුවෙන් 2025 වාර්ෂික සංවර්ධන සැලැස්ම මඟින් රු.13,860,000 ක ප්‍රතිපාදන සලසා තිබුණු වාගොල්ල දිස්ත්‍රික් කෘෂි පුහුණු මධ්‍යස්ථානයේ ව්‍යාපෘති 05 ක් සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කර නොතිබුණි. ඒ තුළ ඇතුළත්ව තිබුණු රු.මිලියන 08 ක වාගොල්ල දිස්ත්‍රික් කෘෂි පුහුණු මධ්‍යස්ථානයේ භෝජනාගාරය ඉදිකිරීමේ කර්මාන්තය සඳහා 2026 සංවර්ධන සැලැස්ම මඟින් ද රු.මිලියන 30 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණි. | මා ඔය රක්ෂිතය ආශ්‍රිතව මෙම ගොඩනැගිල්ල පිහිටා ඇති බැවින් මෙම ඉදිකිරීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය වෙතින් එකඟතාවය ඉල්ලා සිටි නමුත් ඒ සඳහා පිළිතුරක් නොලැබුණු බැවින් කර්මාන්තය ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. ඉදිරියට සංවර්ධන සැලැස්මට ව්‍යාපෘති ඇතුළත් කිරීමට පෙර නිසි ශක්‍යතා අධ්‍යයනයකින් පසු ක්‍රියාත්මක කිරීමට හැකි අත්‍යවශ්‍ය යෝජනා ඇතුළත් කිරීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබා දී ඇති බව. | ඉදිරියේ දී සංවර්ධන සැලැස්මට ව්‍යාපෘති ඇතුළත් කිරීමේදී නිසි ශක්‍යතා අධ්‍යනයකින් පසු ක්‍රියාත්මක කළ හැකි ව්‍යාපෘති පමණක් ඇතුළත් කළ යුතු ය. |

## 1.5.16 ශීර්ෂය - 851 - පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

### 1.5.16.1 ආදායම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට රු.112,515,138ක හිඟ ඉඩම් බදු ශේෂයක් පැවතුණි. ඒ තුළ වසර 02 කට වැඩි හිඟ ඉඩම් බදු වටිනාකම රු.82,768,987 ක් වන අතර එය සමස්ත හිඟ ඉඩම් බදු මුදලින් සියයට 73 ක් විය. | හිඟ බදු අයකිරීම සම්බන්ධයෙන් නිලධාරීන් වෙත උපදෙස් ලබා දීම හා හිඟ බදුකරුවන් දැනුවත් කිරීම සිදුර ඇති බව. | අදාළ නිලධාරින් යොදවාගෙන හිඟ ආදායම් අයකිරීම කාර්යක්ෂම කළ යුතු ය. |

### 1.5.16.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| පුද්ගලික සන්නිවේදන සමාගමක් විසින් කලවාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ තපස්සරකන්ද ග්‍රාම නිලධාරී වසමේ හා කුකුළේගම උතුර ග්‍රාම නිලධාරී වසමේ පිහිටි පිළිවෙලින් පර්චස් 20 ක හා 15.1 ක ඉඩම් කොටස් 02 ක දුරකථන විකාශන කුළුණු ඉදිකර පිළිවෙලින් 2008 ජුනි 04 හා 2015 මාර්තු 22 දින සිට තරංග සම්ප්‍රේෂණ කටයුතු ආරම්භ කර තිබුණි. එහෙත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අනුමැතිය ලබාගෙන එම ඉඩම් දීර්ඝකාලීන බදු ලබා දී බදු මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කඩිනමින් බදු අනුමැතිය ලබාදීමට කටයුතු සිදු කරන ලෙස සිහිකැඳවීම් යොමු කර ඇති බව. | කඩිනමින් බදු අනුමැතිය ලබාගෙන අදාළ ඉඩම් කොටස් දීර්ඝ කාලීන බදු දී ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු ය. |

### 1.5.16.3 මතභේදයට තුඩු දෙන ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රජයේ ඉඩම් ආඥා පනත යටතේ නිකුත් කරන දීර්ඝකාලීන බදු, එළදා බදු, වාර්ෂික බලපත්‍ර හා ජලය හරවා ගැනීම වෙනුවෙන් දෙනු ලබන අවසර පත්‍ර සඳහා අයවිය යුතු බදු මුදල් අයකරන නිලධාරීන්ට දිරි | ඉඩම් කොටස සඳහා නොදියුණු වටිනාකම සම්පූර්ණයෙන් අයකර නිදහස් දීමනා පත්‍රයක් ලබාදීමට අනුමැතිය ලබා දී ඇත. එය බද්දක් යටතට ගැනෙන බව. | මෙම ඉඩම් පැවරීම අමාත්‍ය මණ්ඩල තීරණයෙහි ඇතුළත් කිසිදු බදු වර්ගයකට අයත් නොවන බැවින් අවිධිමත් අනුමැතියක් මත ගෙවා |

| | | | |
|---|---|---|---|
| | දීමනාවක් ගෙවීමට 2009 අගෝස්තු 12 දිනැති අංක 2009/67 දරන සබරගමුව පළාත් අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබා දී තිබුණි. එකී අනුමැතිය පදනම් කර ගනිමින් රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දෙමුවාවත පිහිටි පර්චස් 22 ක රජයේ ඉඩම් කොටසක් 2018 ජූලි 11 දිනැති කැබිනට් අනුමැතියට අනුව 2024 වර්ෂයේ දි ඉඩමේ නොදියුණු වටිනාකම වූ රු.මිලියන 132.6 ක් අයකර දීමනා පත්‍රයක් මඟින් ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය වෙත පවරා දීමේ දී, එම මුදලෙන් සියයට 11 ක් එනම් රු.මිලියන.14.59 ක් දිරි දීමනා ලෙස පළාත් සභා නිලධාරීන් 43 කට සහ රත්නපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් 09 කට ගෙවා තිබුණි. උක්ත ඉඩම් පැවරීම අමාත්‍ය මණ්ඩල තීරණයෙහි ඇතුළත් කිසිදු බදු වර්ගයකට අයත් නොවන රජයේ ආයතන දෙකක් අතර ඉඩමේ අයිතිය හුවමාරු වීමක් පමණක් වන බැවින් එම දිරි දීමනා ගෙවීම අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනි අවිධිමත් ගෙවීමක් විය. | | ඇති දිරි දීමනාව ආපසු අයකළ යුතු ය. |
| (ආ) | 1969 අංක 16 දරන පනතින් හා 1981 අංක 27 දරන ඉඩම් සංවර්ධන (සංශෝධිත) පනතින් සංශෝධිත ඉඩම් සංවර්ධන ආඥා පනතේ ඉඩම් නියෝග 173 මඟින්, ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ අවසර පත්‍රයක් වෙනුවෙන් අයකරගතයුතු වාර්ෂික වාරිකයන් එකතු කර ගැනීම සඳහා පත්කර ඇති නිලධාරීන්ට, එකතු වන්නා වූ මුදලින් සියයට 10ක් නොඉක්මවන කොමිස් මුදලක් ගෙවීමට ප්‍රතිපාදන සලසා තිබුණි. එසේ වුවද, පනතේ සඳහන් එකී සීමාව ඉක්මවා යමින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන්ට සියයට 08 ක් ද පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට සියයට 02 ක් ද ප්‍රතිග්‍රහන රාජකාරී | පළාත් සභාවට අයවිය යුතු බදු මුදල් අයකරන නිලධාරීන් වෙත 2007 සිට දිරි දීමනා ගෙවීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති බව. | ඉඩම් සංවර්ධන ආඥා පනතේ විධිවිධාන ඉක්මවා දීමනා ගෙවීම සිදු නොකළ යුතු ය. පළාත් අමාත්‍ය මණ්ඩලය වෙත යෝජනා ඉදිරිපත් කිරීමේ දී පවතින නීති රීති හා රෙගුලාසි ඉක්මවා නොයන පරිදි එම යෝජනා සකස් කර දීමට ඉහළ කළමනාකරණය හැමවිටම කටයුතු කළ යුතු අතර, අවිධිමත් අනුමැතියක් මඟින් ගෙවා ඇති මුදල් අයකළ යුතු ය. |

| | | |
|---|---|---|
| සඳහා (පළාත් සභා සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල) නිලධාරීන්ට සියයට 01 ක් ද ලෙස සියයට 11 ක දිරි දීමනාවක් ගෙවීමට පළාත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. | | |

**1.5.17 ශීර්ෂය 852 - පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

**1.5.17.1 කාර්ය සාධනය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තරුණ ගොවි කෘෂි උද්‍යානයක් පිහිටුවීම සඳහා 2023 -2025 තුන් අවුරුදු සැලැස්මක් සහිතව ආරම්භකර තිබුණු ඇඹිලිපිටිය කෘෂි උද්‍යානය වෙනුවෙන් 2023,2024 හා 2025 වර්ෂවලදී රු.4,170,827 ක වියදමක් දරා තිබුණ ද කෘෂි උද්‍යානය පිහිටුවීමේ අරමුණු ඉටුකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | කෘෂි උද්‍යානය පිහිටි ඉඩමේ අයිතිය නිරවුල් නොවීම නිසා බෝග වර්ග වගා කිරීම ප්‍රමාද වීම. 2026 වර්ෂය සඳහා නිෂ්පාදන සැලැස්මක් හා පුහුණු සැලැස්මක් සකස් කර කටයුතු සිදු කරන බව. | ඉඩමේ අයිතිය නිරවුල් කර ගැනීමට හා අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සඳහා වඩාත් සැලසුම් සහගතව කටයුතු කළ යුතු ය. |

**1.5.17.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම මඟින් වටිනාකම රු.33,123,975 ක් වූ එළවළු හා පළතුරු පැල මිලදී ගැනීමට සැලසුම් කර තිබුණද, වර්ෂය තුළ මිලදී ගෙන තිබුණු එළවළු හා පළතුරු පැලවල වටිනාකම රු.9,094,551 ක් විය. එමෙන්ම, දෙපාර්තමේන්තුව සතු ගොවිපල 03 ක නිපදවන ලද රු.5,191,200 ක් වූ පැල 18,757 ක් 2025 දෙසැම්බර් 31 දිනට ඉතිරිව තිබියදී රු. 2,059,745 ක් වූ පැල 33,766 ක් බාහිර පාර්ශවයන් වෙතින් මිලදී ගෙන තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන අතර සම්බන්ධීකරණය තුළින් අවශ්‍ය පැල වර්ග දෙපාර්තමේන්තුවේ ගොවිපල මගින් ලබා ගැනීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි. | ව්‍යාපෘති සඳහා අනුමැතිය හිමි නොවීම නිසා රු.මිලියන 15 ක පමණ පැල මිලදී ගැනීමට නොහැකිවිය. දෙපාර්තමේන්තුවට අවශ්‍ය පැල පිළිබඳ ගොවිපළ තුළින් විමසා සැපයිය හැකි ප්‍රමාණය මිලදී ගෙන ඇති බව. | දෙපාර්තමේන්තුවේ පැළ අවශ්‍යතාවය වර්ෂය ආරම්භයේදී හඳුනාගෙන ගොවිපල තුළ නිෂ්පාදනය කර ගැනීමට හැකි සෑම පියවරක් ම ගත යුතු ය. එසේ ම, වාර්ෂික අයවැය හා ක්‍රියාකාරී සැලැස්ම මගින් ප්‍රතිපාදන වෙන් කර අනුමත කරන ලද ව්‍යාපෘති පමණක් ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කළ යුතු අතර හැකි සෑම විටම දෙපාර්තමේන්තුවට අයත් ගොවිපල තුළින් පැළ ලබා ගැනීමට කටයුතු කළ යුතු ය. |